# නාලන්දා විද්‍යාලය - කොළඹ 10

NALANDA VIDYALAYA

## ඒකක පරීක්ෂණ ව්‍යාපෘතිය

**6 ශ්‍රේණිය** | **නර්තනය** | **ඒකකය: 6 - ශ්‍රී ලාංකේය ජන ගායනා හඳුනා ගනිමු.**

- **හරි නම් (✓) ලකුණ ද වැරදි නම් (×) ලකුණ ද වරහන තුළ යොදන්න.**

1) නැළවිලි කවි සඳහා ඊට ආවේනික වූ නාද මාලාවක් ඇත. ( )
2) දරුවන් නැළවීම සඳහා නැළවිලි කවි ගායනා කරයි. ( )
3) නැළවිලි කවි ලයාන්විතව ගායනය නොකරයි. ( )
4) නැළවිලි කවි සෑම ජන කොට්ඨාශයකටම පොදුය. ( )

- **ප්‍රශ්න අංක 05 සිට 14 දක්වා නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.**

5) 'ලත් පමණට මැටි ඉදි කරවා ගෙන' මෙම කළ ගෙඩි කවියේ මීළඟ පාදය කුමක් ද?
   1) අත් නැරම කළ ගෙඩි තෝරා ගෙන
   2) පත් බැඳලා කළ ගෙඩි තනවා ගෙන
   3) සිත් සතොසින් කළ පිඹින්ට වෙන වෙන
   4) රිදී දිලෙන තෝඩුත් එල්ලා ගෙන

6) 'අතට වෙරළු ඇහිඳ ගෙනේ ' මෙම කවිය,
   1) ලී කෙළි කවියකි.
   2) කළ ගෙඩි කවියකි.
   3) නැළවිලි කවියකි.
   4) වන්නම් කවියකි.

7) 'නුඹෙ අම්මා කොතැන ගියේ' මෙම නැළවිලි කවියේ මීළඟ පාදය වන්නේ කුමක් ද?
   1) කිරි එරවා එන්ට ගියේ
   2) ගඟට උඩින් කොක්කු ගියේ
   3) ගඟ දෙගොඩින් ගලා ගියේ
   4) කිරි මුට්ටිය ගගේ ගියේ

Agaram.LK - Keep your dreams alive!
Agaram.LK - Keep your dreams alive!
agaram.lk

- **ප්‍රශ්න අංක 08 සිට 10 දක්වා පහත කවිය ඇසුරින් නිවැරදි පිළිතුරු සපයන්න.**

මුනි සිරිපා සිඹිමින් නේ
සමනොළ ගිර පෙදෙසින් නේ
මඳ සුළඟයි මේ එන් නේ
මගේ පුතා නැළවෙන් නේ

8) මෙම කවි යොදා ගන්නේ කුමන ජන ගායනා වර්ගයක් සඳහා ද?
1) කෙළි ගී 2) නැළවිලි ගී
3) කළ ගෙඩි කවි 4) ලී කෙළි කවි

9) ඉහත කවිය ඇතුළත් ග්‍රන්ථය කුමක් ද?
1) හීන් සැරය 2) ගී මියැසිය
3) ළමා කවි කළඹ 4) ජාතික තොටිල්ල

10) ඉහත පද්‍ය ඇතුළත් ග්‍රන්ථය රචනා කරන ලද්දේ කවරෙකු විසින් ද?
1) මුනිදාස කුමාරතුංග මහතා. 2) එස්. මහින්ද හිමි.
3) සිබිල් වෙත්තසිංහ මහත්මිය. 4) මාටින් වික්‍රමසිංහ මහතා.

11) නැළවිලි කවි ගායනා කරනු ලබන්නේ,
1) විලම්බ ලයෙනි. 2) මධ්‍ය ලයෙනි.
3) දෘත ලයෙනි. 4) අති දෘත ලයෙනි.

12) දරු නැළවිලි ගායනා අයත් වන්නේ කුමන ගී වර්ගයකට ද?
1) සෙත් ගී 2) මෙහෙ ගී
3) යාග ගී 4) ජන ගී

13) නැළවිලි කවි ගැයෙන තාල රූපය කුමක් ද?
1) මාත්‍රා 2 තනි තිත 2) මාත්‍රා 3 තනි තිත
3) මාත්‍රා 4 තනි තිත 4) මාත්‍රා 2+3 දෙතිත

14) 'රෝ රෝ රෝ රොයි කැකුළී' මෙය,
1) බටහිර සංගීත කණ්ඩායම් ගීතයක පාදයකි.
2) ආදි වාසීන්ගේ දරු නැළවිලි ගීයක පාදයකි.
3) ගැමි නැටුමක යෙදෙන කවි පාදයකි.
4) අභිගුණ්ඨික ගෝත්‍රිකයන්ගේ නැළවිලි ගීතයකි.

- **කෙටි පිළිතුරු සපයන්න.**

15) නැළවිලි කවියක හඳුනාගත හැකි විශේෂ ලක්ෂණ 02ක් සඳහන් කරන්න.

16) ඔබ උගත් නැළවිලි කවි 02ක් ලියන්න.

**සැකසුම : නවමල් ජයවීර මයා**

Agaram.LK - Keep your dreams alive!
Agaram.LK - Keep your dreams alive!
agaram.lk



agaram.lk